---

**විසර්ජන ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

---

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) රජයේ කාර්යයන් සම්බන්ධීකරණය.

(ආ) ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් නිලධාරින් හා සංවිධාන මාර්ගයෙන් නීතියෙන් පවරා දී ඇති කාර්යයන් සාධනය කිරීම.

(ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීම.

(ඈ) විවිධ ශීර්ෂයන්ට අදාල ආදායම් එකතු කිරීම.

(ඉ) විමධ්‍යගත අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඊ) පළාත් සභාවලට ඒවායේ කටයුතුවලදී සහාය වීම.

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

(අ) අයගම

(ආ) ඇලපාත

(ඇ) ඇහැලියගොඩ

(ඈ) ඇඹිලිපිටිය

(ඉ) ඉඹුල්පේ

(ඊ) ඕපනායක

(උ) කලවාන

(ඌ) කහවත්ත

(එ) කිරිඇල්ල

(ඒ) කුරුවිට

(ඔ) කොලොන්න

(ඕ) ගොඩකවෙල

(ක) නිවිතිගල

(ග) පැල්මඩුල්ල

(ච) බලංගොඩ

(ජ) රත්නපුර

(ට) වැලිගෙපොල

## 1.3 විගණන විෂය පථය

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අප්‍රේල් 19 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ, මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.13 දක්වා ඡේද වල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ගිණුම් ඉදිරිපත් කිරීම

2002 සැප්තැම්බර් 12 දිනැති අංක පීඑෆ් 402 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.3.2 ඡේදය ප්‍රකාර විෂය අංක 27801 දරණ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2013 මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එය විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2013 අප්‍රේල් 22 දින දීය.

(ආ) විසර්ජන ගිණුම

(i) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 684,103,584 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු. 650,319,128 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 33,784,456 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.9 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 419,000,000 | 618,303,584 | 3,093,755 | 0.5 |
| මූලධන | 65,800,000 | 65,800,000 | 30,690,701 | 46.6 |
| එකතුව | 484,800,000 | 684,103,584 | 33,784,456 | 4.9 |

(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

- විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 21 කින් හා දෙපාර්තමේන්තු 13 කින් පිළිවෙලින් රු. 2,501,440,901 ක් හා රු. 1,050,008,217 ක් වශයෙන් රු. 3,551,449,118 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් පිළිවෙලින් රු. 2,492,896,304 ක් හා රු. 1,020,051,403 ක් වශයෙන් රු. 3,512,947,707 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. 38,501,411 ක ලැබී තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 1 ක ඉතිරියක් අනාවරණය විය. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දී තිබුණු රු. 2,381,720,243 ක ප්‍රතිපාදනය රු. 1,380 කින් ඉක්මවා රු. 2,381,721,623 ක් උපයෝජනය කර තිබුණි.

- මහා භාණ්ඩාගාරයේ අක්මුදල් නොලැබීම නිසා ඉහත ප්‍රතිපාදන ඉතිරි වූ බව 2013 මැයි 13 වන දින රත්නපුර දිස්ත්‍රික් ලේකම් මා වෙත දන්වන ලදී.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 27801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 50,000,000 | 49,112,713 | 30,000,000 | 44,350,411 | 185,000,000 | 145,686,909 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

විෂය අංක 27801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 1,648,279 ක් විය.

(ඈ) පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු. 215,929,636 ක් වී තිබුණු අතර එම ශේෂයෙන් වර්ෂ 02 ඉක්ම වූ රු. 2,922,739 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.6 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 1.6.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402 (1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 මැයි 23 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත කුළුණක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් ලබාදී වර්ෂ 12 ක් ගතව තිබුණත් එම ඉඩම් කොටස තක්සේරු කර දීර්ඝකාලීනව බදු දී බදු මුදල් අයකර ගැනීමට 2012 පෙබරවාරි 15 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

## 1.8 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | |
| මු.රෙ. 139 (1) හා මු.රෙ. 257 | 10,369,526 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් ගෙවීම් වවුචර් 232 ක ගෙවීම් සහතික කර නොතිබුණි. |
| මු.රෙ. 137 | 876,474 | ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 876,474 ක ගෙවීම් අනුමත කර නොතිබුණි. |
| මු.රෙ. 237 | 290,000 | ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශේෂ සහතිකයක් ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් රු. 290,000 ක් ගෙවා තිබුණි. |

(ii) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2004 දෙසැම්බර් 27 දිනැති අංක 22/99 (iv) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත අංක 22/99 චක්‍රලේඛය | 20,650 | 2006 ඔක්තෝබර් සිට 2011 අගෝස්තු දක්වා කාලය තුල ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ නිල රථය පෞද්ගලික ගමන් සඳහා යොදා ගැනීම වෙනුවෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර මුදල් අය කර නොතිබුණි. |
| | 7,000 | 2005 ජනවාරි සිට 2008 අප්‍රේල් දක්වා කාලය තුල රාජකාරී කටයුතු කළ කොලොන්න ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් නිල රථය පෞද්ගලික ගමන් සඳහා භාවිතා කිරීම වෙනුවෙන් තවදුරටත් අයවිය යුතුව තිබූ මුදල සම්බන්ධව කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| 2006 ජූලි 14 දිනැති අංක 11/2006 දරණ චක්‍රලේඛය | - | බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්ගේ නිල වාහනය සම්බන්ධයෙන් 2012 පෙබරවාරි 16 දින සිට විගණිත දිනය වූ 2013 ජනවාරි 28 දින දක්වා චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම II ප්‍රකාරව දෛනික සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. වෙන් කළ වාහනයේ රාජකාරීවල යෙදෙන රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීමේදී චක්‍රලේඛයේ ඇමුණුම II හි සඳහන් දෛනික සටහන් ඉදිරිපත් කළ යුතු වුවත්, එසේ එම සටහන් ඉදිරිපත් නොකර අතිකාල හා සංයුක්ත දීමනා ගෙවා තිබුණි. |
| 2011 මාර්තු 31 දිනැති අංක එච්ඒඑෆ් - 2/19/එම්ජීටීසීඑම්/15/1907 දරණ චක්‍රලේඛ ලිපිය | 45,575 | 2006 ජූලි 01 දින සිට 2008 දෙසැම්බර් 31 දක්වා කාලය තුල කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටි ප්‍රාදේශීය ලේකම්වරයා වෙත වැඩිපුර ගෙවා තිබුණු රාජකාරි ඉටුකිරීමේ දීමනා හා වැඩ බැලීමේ වැටුප් අයකර ගෙන නොතිබුණි. |

**1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්

ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තුංකම,එපිටගොඩ මැද පාර ගල් අතුරා තාර දැමීම සඳහා රු. 341,237 ක වටිනාකමින් යුත් ගිවිසුමකට 2012 අගෝස්තු 05 දින එළඹ තිබුණත් අධික වර්ෂාව හේතුවෙන් කර්මාන්තය ආරම්භ කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | අතහැර දැමීමට හේතු |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| (i) නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පනහැටගල අඩි පාලම ඉදිකිරීම. (ද්‍රව්‍ය ආධාර) | 480,000 | 2011/09/25 | 155,922 | ගිවිසුම්ගත කාලය තුළ වැඩ අවසන් කිරීමට සංවිධානයට නොහැකි වීම හා වෙනත් සංවිධානයකට ලබාදීමට කාලය ප්‍රමාණවත් නොවීම, අපේක්ෂිත ප්‍රජා සහභාගීත්වය නොමැති වීම. |
| (ii) ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩවෙල ඩිංගිරිහාමිගොඩ මාර්ගය සංවර්ධනය කිරීම. | 1,000,000 | 2012/06/08 | 218,310 | ව්‍යාපෘතිය කරගෙන යන අතරතුර ප්‍රමිතිය පරීක්ෂා කිරීමේදී ව්‍යාපෘතිය නිසි ප්‍රමිතියෙන් තොරවීම. |

(ඇ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | රු. | | | රු. | |
| | ඇහැලියගොඩ | | | | | |
| (i) | බ/කලටුවාව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 1,226,263 | 2012/11/30 | 2012/12/31 | නැත | සමිතියක් ගිවිසුම්ගත වීමට ප්‍රමාද වීම. |
| (ii) | තොරණගොඩ පාළුගෙදරවත්ත පානීය ජල ව්‍යාපෘතිය | 980,000 | 2012/10/05 | 2012/12/15 | නැත | ව්‍යාපෘතිය සංශෝධනය වීම හා අයහපත් කාලගුණ තත්ත්වය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ඇඹිලිපිටිය | | | | | |
| (iii) | තෝරකොළයාය සිහිති උයන පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම. | 380,450 | 2012/08/15 | 2012/12/15 | නැත | ස්ථානය වෙනස් කිරීම |
| | නිවිතිගල | | | | | |
| (iv) | වටාපොත සුදර්ශන දහම් පාසලට උපකරණ ලබා දීම. | 50,000 | 2012/10/09 | 2012/12/31 | නැත | මිලදී ගැනීම් ප්‍රමාදය |
| (v) | තුත්තිරිපිටිය සමගි මාවත සංවර්ධනය කිරීම. | 100,000 | 2012/05/30 | 2012/12/31 | 195,000 | අවිච්ඡේද කරන ලදී. |
| (vi) | නවංගොඩ පාලම ඉදිකිරීම. | 4,000,000 | 2011/07/01 | 2012/12/31 | 3,189,356 | අවිච්ඡේද කරන ලදී. |
| (vii) | පහලකන්ද ක්‍රීඩා පිටිය සකස් කිරීම. | 75,000 | 2012/11/21 | 2012/12/31 | නැත | අවිච්ඡේද කරන ලදී. |
| (viii) | වත්තහේන ශ්‍රී සුධර්ශනාරාම බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම. | 100,000 | 2012/10/02 | 2012/12/31 | නැත | අවිච්ඡේද කරන ලදී. |
| (ix) | වත්තහේන ශ්‍රී සුධර්ශනාරාම බහුකාර්ය ගොඩනැගිල්ලේ වහලය සැකසීම. | 100,000 | 2012/10/02 | 2012/12/31 | නැත | අවිච්ඡේද කරන ලදී. |
| (x) | පොල්ගහවත්ත දොලොස්වල වත්ත මාර්ගය කපා සැකසීම. | 100,000 | 2012/10/02 | 2012/12/31 | නැත | අවිච්ඡේද කරන ලදී. |
| (xi) | දැල නවංගොඩ පාර බෝක්කුව ඉදිකිරීම. | 150,000 | 2012/12/08 | 2012/12/31 | නැත | අවිච්ඡේද කරන ලදී. |
| (xii) | වතුපිටිය හොරංගල පාර කොන්ක්‍රීට් කිරීම. | 100,000 | 2012/12/17 | 2012/12/31 | නැත | අවිච්ඡේද කරන ලදී. |
| (xiii) | කරවිට පිංකන්ද හරහා ඉහල කොටස මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 150,000 | 2012/12/19 | 2012/12/31 | නැත | අවිච්ඡේද කරන ලදී. |

(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ දුර්වලතා

i. කලවාන

- රඹුක දිමුතු පෙර පාසල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ වැඩ විෂය අංක 02 යටතේ වහලයට යොදා තිබූ මීටර් 38 ක දිගින් යුත් පරාල අනුමත ප්‍රමිතියෙන් තොර පළුදු සහිත දැව වලින් නිම කර තිබූ අතර යොදා තිබූ බාල්ක සහ යටලී වේයන් විසින් හානි කර තිබුණි. එහෙත් ඇස්තමේන්තු ප්‍රකාරව පළමුවන පන්තියේ අනුමත ප්‍රමිතියෙන් යුත් දැව යොදා ගෙන නොතිබූ මෙම වැඩ විෂයයන් සඳහා දැව ඝන මීටර් 0.285 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත රේටයන් මත රු. 25,226 ක මුදලක් ගෙවා තිබුණි.
- නාරගල්පිටිය හරහා විශ්කම්ගොඩ මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ වැඩ විෂය අංක 03 කට ගෙවීම් කිරීමේදී නිසි ප්‍රමිතියෙන් තොර ලිහෙන සුළු ස්වභාවයෙන් යුත් දිග මීටර් 71.2 ක කොටසක් කොන්ක්‍රීට් කිරීම සඳහා ඇස්තමේන්තුගත රේටයන් අනුවම කිසිදු අඩුකිරීමකින් තොරව රු. 269,093 ක මුදලක් ගෙවා තිබුණි.

- පොතුපිටිය දෙව්රූ බිත්තිය අසල සිට කෙසෙල්වත්ත මාර්ගය කපා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ වැඩ විෂය අංක 02 යටතේ ඇස්තමේන්තුගත උපදෙස් හා සැලැස්මට අනුකූල නොවූ අනුමත ප්‍රමිතියෙන් තොර කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදාගෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම හේතුවෙන් මාර්ගයේ දිග මීටර් 16 ක කොන්ක්‍රීට් ස්ථරය දුර්වල තත්ත්වයක පැවති ලිහෙන සුළු ස්වභාවයෙන් යුක්ත විය. එහෙත් එම කොටස සඳහා කොන්ක්‍රීට් ඝන මීටර් 1.95 ක් සඳහා ඇස්තමේන්තුගත රේටයන් අනුවම කිසිදු අඩුකිරීමකින් තොරව රු. 28,880 ක මුදලක් ගෙවා තිබුණි.

ii. කිරිඇල්ල
-----------
රු. 977,549 ක් වැය කර ඉදි කරන ලද මුළු දිග අඩි 806 ක් වූ මුදුන්කොටුව මාරදාවක මාර්ගය අනුමත තත්ත්වයෙන් තොර කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා ගෙන කොන්ක්‍රීට් කිරීම හේතුවෙන් සම්පූර්ණ මාර්ගයේම කොන්ක්‍රීට් ඉතා පහසුවෙන් ලිහෙන සුළු වූ අතර මාර්ගයේ ඉදි කිරීම් කටයුතු අවසන් කර මාස 06 ක් ගතවීමටත් පෙර මාර්ගයේ මතුපිට ස්ථරය සේදී ගල් මතු වී මාර්ගය අබලන් වීමේ තර්ජනයට ලක්ව තිබුණි.

iii. පැල්මඩුල්ල
--------------
විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ විදුලිය ව්‍යාපෘති 04 ක් සඳහා විදුලිබල මණ්ඩලය වෙත රු. 467,400 ක මුදලක් ගෙවා තිබුණද, එම ව්‍යාපෘති නිම කර ජනතා අයිතියට පවරා දීමට 2012 ජුලි 20 දින දක්වාම ක්‍රියාකර නොතිබුණි. මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණු අතර ව්‍යාපෘති අවසන් වී නොතිබියදී වැඩ අවසන් කළ බව ප්‍රගති වාර්තාවල සඳහන් කර තිබුණි.

iv. ඇඹිලිපිටිය
-------------
කුට්ටිගල කම්හල අසලින් කරවිලයාය පාර කච්චිගල දක්වා කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ මාර්ගයේ මීටර් 31 ක දිගින් යුතු කොටසක් කොන්ක්‍රීට් කිරීම නිසි ප්‍රමිතියෙන් යුක්තව සිදුකර නොතිබුණු අතර එම කොටස් සම්පූර්ණයෙන්ම ඉරිතලා පුපුරා ගොස් තිබුණි. මාර්ගයේ එම කොටසට අදාලව ඝන මීටර් 9.3 ක් කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රු. 98,482 ක මුදලක් ගෙවා තිබුණි.

v. නිවිතිගල
-----------
- ප්‍රාදේශිය ලේකම් නිල නිවස අළුත්වැඩියා කිරීමේ වැඩ ඇස්තමේන්තුවට අදාල වැඩ විෂයයන් 10 ක් සඳහා රු. 339,368 ක් ගෙවා තිබුණු අතර එම වැඩ කොටස් ගුණාත්මක බවින් තොරවීම, ප්‍රමිතියට අනුකූල නොවීම, විධිමත් පරිදි ඉටු කර නොතිබීම, පැරණි උපාංග සවිකර තිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.

- කිරිබත්ගල විද්‍යාලයේ වැසිකිලි ඉදිකිරීම සම්බන්ධයෙන් වැඩ කොටස් 02 ක් සඳහා එකතුව රු. 65,150 ක් ගෙවා තිබුණු අතර එම වැඩ කොටස් දෙකෙහි දොර හා උළුවහු සැකසීමේදී පිත්තල උපාංග වෙනුවට යකඩ උපාංග සවි කර තිබීම හා පළමු පන්තියේ දැව වෙනුවට වහලය සැකසීමේදී අලංවි සහිත ගිනිකූරු දැව භාවිතා කර තිබුණි.

(ඉ) නිශ්ඵල වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| කාර්යාලය | ව්‍යාපෘතිය | වියදම<br>රු. | නිරීක්ෂණය |
|---|---|---|---|
| ඇඹිලිපිටිය | හිඟුර බෝගල් ආර ජල යෝජනා ක්‍රමයේ ටැංකිය ඉදිකිරීම | 267,655 | භාවිතය සඳහා නොගනී. |
| කොලොන්න | කාර්යාලයේ අභ්‍යන්තර වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම | 106,147 | වැසිකිලි පද්ධතිය භාවිතයට නොගනී. |

(ඊ) සාවද්‍ය මිනුම් මත ගෙවීම් සිදු කිරීම

පහත සඳහන් ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් සාවද්‍ය මිනුම් මත රු. 639,437 ක් වැඩිපුර ගෙවා තිබුණි.

| කාර්යාලය | ව්‍යාපෘතිය | වැඩ විෂය ගණන | වැඩිපුර ගෙවූ මුදල<br>රු. |
|---|---|---|---|
| නිවිතිගල | මහානාම විද්‍යාලයේ වැසිකිලි ඉදි කිරීම | 01 | 14,809 |
| | එරබද්ද විද්‍යාලයේ පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 03 | 28,574 |
| | පොල්වත්ත වෙල්යායේ පැති බැම්ම ඉදි කිරීම | 05 | 362,262 |
| ඇඹිලිපිටිය | කෝන්කටුව වැවේ ප්‍රධාන ඇල මාර්ග දෙක පිළිසකර කිරීම | 01 | 113,600 |
| කිරිඇල්ල | දෙහෙරගොඩ පන්මුල්ල අමුණ ඇල කොන්ක්‍රීට් කිරීම | 01 | 82,536 |
| රත්නපුර | සිල්වර්ලැන්ඩ් ඇවන්ඩල් සිට ඉදිරියට ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 01 | 37,656 |
| | | | 639,437 |

(උ) ඉටු නොකළ වැඩ වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ව්‍යාපෘති 03 ක් සම්බන්ධයෙන් වැඩ විෂයයන් 09 ක් ඉටු නොකර තිබියදී ඒ වෙනුවෙන් රු. 324,765 ක් ගෙවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| කාර්යාලය | ව්‍යාපෘතිය | ඉටු නොකළ වැඩ විෂය ගණන | ගෙවා තිබුණු මුදල |
|---|---|---|---|
| | | | රු. |
| අයගම | ර/අයගම ජනපද විද්‍යාලයට වැසිකිලි හා කැසිකිලි පහසුකම් ලබා දීම. | 01 | 3,931 |
| ඉඹුල්පේ | පඹහින්න අත්පන්දු ක්‍රීඩාංගනයේ පිටත දැල් ආවරණය සකසා විදුලි ලාම්පු සවි කිරීම | 06 | 58,450 |
| ඇඹිලිපිටිය | කුට්ටිගල කම්හල අසලින් කරවිලයාය පාර කච්චිගල දක්වා කොන්ක්‍රීට් කිරීම | 01 | 38,644 |
| | කෝන්කටුව වැවේ ප්‍රධාන ඇල මාර්ග දෙක පිලිසකර කිරීම | 01 | 223,740 |
| | | | 324,765 |

(ඌ) ව්‍යාපෘති පරිපාලනයේ දූර්වලතා

සැලසුම් පිළියෙල කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම, කොන්ත්‍රාත් ගිවිසුම් විධිමත් පරිදි ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කිරීම යනාදී පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කිරීමකින් තොරව ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිංචිගුණේ ප්‍රජා ශාලාව ඉදි කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබු අතර විගණිත දිනය වූ 2012 නොවැම්බර් මස 16 දින වන විට මෙහි ඉදි කිරීම් කටයුතු අතරමග නවතා දමා තිබුණු බව භෞතිකව නිරීක්ෂණය විය.

(එ) ඇස්තමේන්තු සකස් කිරීමේ දූර්වලතා

බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ගොඩකුඹුර, ඉඹුලාමුර විද්‍යාලයේ වැසිකිලි ඉදි කිරීමේ ව්‍යාපෘතිය යටතේ යාබදව ඉදි කරන ලද වැසිකිලි 02 ක් සඳහා එක් වැසිකිලි වලක් ඉදි කිරීම වඩා යෝග්‍ය හා පිරිමැසුම්දායක වුවද එම වැසිකිලි 02 සඳහා එකිනෙකට යාබදව වැසිකිලි වලවල් 02 ක් ඉදි කිරීමට ඇස්තමේන්තු සකසා ගෙවීම් කිරීම හේතුවෙන් රු. 36,735 ක මුදලක් අතිරේක වශයෙන් වැය කිරීමට සිදුව තිබුණි.

---

**1.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

ගැලපුම් කළ යුතු ශේෂ

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2012 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය<br>මාස 6 ට වැඩි වර්ෂ 1 ට අඩු<br>රු. |
|---|---|---|
| (i) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 4,000 |
| (ii) | හඳුනා නොගත් බැර | 432,620 |

**1.11 අවිධිමත් ගනුදෙනු**

කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කැල්ල හා අඹගහයාය ග්‍රාම නිලධාරී වසම්වල රජයට අයත් බිම් කොටස් 02 ක දුරකථන සන්නිවේදන කුළුණු 2 ක් ස්ථාපිත කර සම්ප්‍රේෂණ කටයුතු ද ආරම්භ කර ඇතත් එවැනි කුළුණක් රජයේ ඉඩමක ඉදිකිරීමේදී ප්‍රාදේශීය ලේකම් විසින් මුලික වශයෙන් ඉටු කළ යුතු කාර්යයන් කිසිවක් ඉටුකර නොතිබුණි. පලාත් ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අනුමැතියකින් තොරව මෙම දුරකථන කුළුණුවල ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අදාල සමාගම වෙත අවසර ලබා දී තිබුණි. රාජ්‍ය දේපලක් බදු දීම සම්බන්ධව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග නිසිපරිදි ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රජයට කිසිදු ප්‍රතිලාභයක් නොලැබ රජයේ දේපලක් පෞද්ගලික දුරකථන සමාගම් 02 ක් විසින් නීත්‍යානුකූල නොවන අන්දමින් පරිහරණය කරන බව අනාවරණය විය.

**1.12 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුලත්ව තිබුණු විගණන ඡේද රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පසු විපරම් කටයුතු නිම කෙරෙමින් පවතින ඡේද

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2007 | 5.6.4 | දෘෂ්‍ය අක්‍රමිකතා |

(ආ) නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

බී - 06 නිල නිවසේ පදිංචිව සිටින රත්නපුර ප්‍රාදේශීය ලේකම්වරියගෙන් 2010 ජූලි 22 සිට 2013 ජනවාරි 31 දක්වා කාල පරිච්ඡේදයට අදාලව මූලික වැටුපෙන් 10 % ක් ලෙස එකතුව රු.114,180 ක නිල නිවාස කුලියක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ග්‍රාම නිලධාරි නිල නිවාස අංක 01 හි හා අංක 02 හි ග්‍රාම නිලධාරිවරුන් දෙදෙනෙකු පිළිවෙලින් 2005 ජනවාරි මස සිට හා 2012 ජුනි මස සිට පදිංචිව සිටින නමුත් ඒ වෙනුවෙන් කිසිදු මුදලක් නිවාස කුලිය ලෙස අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) නිවිතිගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ප්‍රාදේශීය ලේකම් නිල නිවස අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියේ වැඩ විෂය අංක 02 ට අනුව දිරාගිය සියළු දොරවල් හා ජනේල ගලවා ඉවත් කිරීම වෙනුවෙන් රු. 20,861 ක් ද විෂය අංක 05 ට අනුව නිල නිවසේ ඉදිරිපස කොටසේ වහලයේ දිරාගිය කොටස් ඉවත් කිරීම වෙනුවෙන් රු. 7,008 ක් ද එකතුව වශයෙන් රු. 27,869 ක මුදලක් ගෙවා තිබුණි. මේ අනුව දොරවල් හා ජනේල 19 ක් ද වහලයේ වර්ග අඩි 10.36 ක දැව කොටස් ද ඉවත් කර තිබු නමුත් ජනෙල් පියන් 06 ක් හා බිඳී ගිය ඇස්බැස්ටෝස් තහඩු කැබලි කිහිපයක් හැරුණු විට අන් සියලු දෑ අස්ථානගත වී තිබුණි. ඉවත් කරන දැව හා අනෙකුත් ද්‍රව්‍ය විධිමත් පරිදි ලැයිස්තුගත කර භාර දීමට හෝ භාර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

**1.13 මානව සම්පත් කළමනාකරණය**

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 50 | 07 | - |
| (ii) | තෘතීයික මට්ටම | 40 | 26 | 14 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 1,067 | 867 | 200 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 169 | 173 | - | 04 |
| (v) | වෙනත්(අනියම්/තාවකාලික /කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | එකතුව | 1,333 | 1,118 | 221 | 06 |